# දරුවන් උදෙසා බයිබලයක්

# නාස්තිකාර පුත්‍රයා



**ඉදිරිපත් කරන්නා**: Edward Hughes

**නිදර්ශනය කරන්නා**: Lazarus
Alastair Paterson

**සකස්කරන්නා**: Ruth Klassen; Sarah S.

**පරිවර්ථනය කරන්නා**

**නිෂ්පාදනය කරන්නා**: Bible for Children
www.M1914.org

©2025 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.





දෙවියන් වහන්සේගේ කමාවීමේ ගුණය ගැන මිනිසුන්ට කියන්නට ජේසුස් වහන්සේ ප්‍රිය වූ සේක. නමුත් යුදෙව් නායකයෝ පව්කාරයන් සමඟ උන්වහන්සේ තුළ තිබූ මිත්‍රත්වය ගැන චෝදනා කළහ. එනිසා පව්කාරයන් තමන් කළ පව් ගැන පසුතැවිලි වන විට දෙවියන් වහන්සේ සතුටු වන බව පෙන්වා දීමට යේසුස් වහන්සේ කතාන්දර තුනක් පැවසූ සේක.


පළමු කතාන්දරය
බැටළුවන් සියයක්
අයිතිව සිටි
මිනිසෙතු ගැන විය.
එක් බැටළුවෙකු
නැති විය.
එකෙණෙහිම
එඬේරා අනූනවය
අතහැර අතුරුදහන්
වූ බැටළුවා සොයා
ගියේය.
3


එඬේරා බැටළුවා
සම්බවෙන තුරුම
සෙව්වේය. ඉන්පසු උග
රැගෙන කරමත තබාගෙන
ප්‍රීතියෙන් නිවසට ගෙන
ආවේය. ඔහු ඔහුගේ
යහළුවන්ට කතාකොට
“මට මාගේ නැතිවූ බැටළුවා
සම්බවුන නිසා මා සමඟ
ප්‍රීති වන්නයැ” යි කීවේය.
4


පසුතැවිලි වන එක් පව්කාරයෙකු
ගැන ස්වර්ගයේ මහත් ප්‍රීතියක්
ඇති බව යේසුස් වහන්සේ
පැහැදිලි කළ සේක.
පසුතැවිලි වීම යන්නෙන්
අදහස් කරන්නේ අපගේ
පව් ගැන කණගාටු
වීමයි. ඒ පව් වලින්
ඉවත් වීමට තරම්
කණගාටු වීමයි.
5


යේසුස් වහන්සේ
පැවසූ අනෙක්
කතාව වූයේ රිදී
කාසි දහයක් අයිතිව
තිබූ කාන්තාවක්
ගැනය. සමහරවිට
ඒ ඇය ඇයගේ මුළු
ජීවිත කාලයම ඉතිරි
කරගත් වස්තුව විය
හැකිය. භයානක
දෙයක් සිදු වූයේය.
ඇයගේ එක්
කාසියක් නැතිවිය.
6


ඇය මුළු ගෙදරම අතුගාමින් කාසිය සෙව්වාය.
අවසානයේදී ඇයට ඒ නැතිවූ කාසිය සම්භ විය.
ඇය බොහෝ සේ සන්තෝෂ වූවාය. ඇය කුමක්
කලාදැයි ඔබට සිතිය හැකිද? ඔව්, ඇය ඒ බව
ඇයගේ සියලුම මිතුරන්ට කීවාය.
7


නැවතත් යේසුස්
වහන්සේ, “පසුතැවිලි
වන එක් පව්කාරයෙකු
ගැන දෙවියන්
වහන්සේගේ දූතයන්
ඉදිරියෙහි ප්‍රීතිය
තිබේයැ” යි කී සේක.
8


දුක්බරම කතාව වූයේ ජේසුස් වහන්සේ පැවසූ තුන්වන කතාවයි. එය තම පියාගේ ගෙදර අත්හැර ගිය පිරිමි ළමයෙකු ගැන වූ කතාවකි.
9


ඈත රටකදී ඔහු අනුවණ ලෙස ඔහුගේ මුදල් වියදම් කළේය. දැන් ඔහුට කුමක් කළ හැකිද? තත්වය තවත් නරක අතට හැරෙමින් සාගතයක්ද පැමිණියේය. ළමයා කුසගින්නෙන් මිය යා හැකිව තිබුණි.
10


කුසගින්නෙන් පීඩිත වූ ඔහුට ඌරන් බලාගැනීමේ රැකියාවක් ලැබුණි. නමුත් කිසිවෙකු ඔහුට කෑම දුන්නේ නැත. ඌරන් කෑ කෑමම ඔහුද සතුටින් කැවා විය හැක. සමහර එය ඔහු කරන්නට ඇති! අවසානයේදී ඔහු පියවි සිහියට ආවේය. “නැවත ගෙදර යා යුතුය, එහි සේවකයෝ පවා හොඳින් කන්නෝය” යි ඔහු සිතුවේය.
11


“මම ගෙදර ගොස් මාගේ පව් ගැන මා කණගාටු වන බව මාගේ පියාට කියන්නෙමි. මම තවදුරටත් ඔහුගේ පුත්‍රයා වන්නට නොවටින්නෙමි. මාව ඔහු ඔහුගේ සේවකයෙකු ලෙසින් බඳවා ගන්නවා ඇත”.
12


ගෙදරට බොහෝ දුර තියාම ඔහු එන බව පියා දුටුවේය. පියා ප්‍රීතියෙන් ආපසු එන තම පුතා වෙත දිව ගියේය. ඔහු තම පුත්‍රයා සිපගෙන වැළඳ ගත්තේය.
13


“පියාණෙනි, මම පව් කලෙමි. මම ඔබේ පුතෙකු වන්නට නොවටින්නෙමි.” තමුන්ව සේවකයෙකු ලෙස බඳවා ගන්නා මෙන් පියාගෙන් ඉල්ලන්නට ඔහුට අවශ්‍ය විය. නමුත් පියා ඔහුට බාධා කළේය. “හොඳම කබායද, පාවහන්ද, මුදුවක්ද මාගේ පුත්‍රයාට ගෙනෙන්න. එසේම විශාල සාදයක් සූදානම් කරන්න”.
14

නැතිවී සිටි පුත්‍රයා නැවත හමුවූ නිසා අලංකාර සාදයක් පැවැත්විණි. ජේසුස් වහන්සේ මේ කතාව පැවසුවේ පසුතැවිලි වී තමන් වෙතට පැමිණෙන පව්කාරයන් පිළිගැනීමට දෙවියන් වහන්සේ ප්‍රිය කරන ආකාරය එයින් පෙන්වා දෙන බැවිනි.





නාස්තිකාර පුත්‍රයා

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

ශු. ලූක් 15

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**






45

60



**මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.**

**දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වු සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.**

**මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.**

**ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.**

**දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)**